# අපගේ ඒකාබද්ධ තිරසාර ප්‍රතිපත්තිය

ආයතනික තිරසාරත්වය සඳහා අපගේ කැපවීම, ආයතනයේ දිගුකාලීන ශක්‍යතාවය සහ ලාභදායිත්වය සහතික කිරීම වෙනුවෙන්, අවංක සහ සදාචාරාත්මක අයුරින් ආයතනය මෙහෙයවමින්, සියලුම ක්‍රියාකාරකම් වල සඵලත්වය තහවුරු කිරීමට අවශ්‍ය පෙර සූදානමකින් යුත් උපක්‍රමශීලී ප්‍රවේශයක් ගනී. රටවල් කිහිපයක සහ කර්මාන්ත ගණනාවක මෙහෙයුම් පවතින සමූහ ආයතනයක් වන අපගේ සියලු ක්‍රියාකාරකම්වලින් ධනාත්මක ප්‍රතිඵල ජනනය කිරීමටත්, ආර්ථික, සමාජීය සහ පාරිසරික තිරසාරත්වය රැක ගැනීමටත්, ආයතනයේ කීර්ති නාමය රැක්ගැනීමටත් අපි කැප වෙමු.

මෙම කැපවීම වෙනුවෙන් අපගේ ක්‍රියාකාරකම් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා තිරසර සංවර්ධන උපක්‍රම සමඟ සමගාමීව, 'පළමුව නිවැරදිව ගොඩනැගීම' (Build Better Before) යන මූලධර්මයට අනුව; හානිකර බලපෑම් සීමා කිරීමට, අපගේ මෙහෙයුම් මගින් ඇති කරන අගය වැඩි කිරීමට සහ තිරසාර සංවර්ධනය වැඩි දියුණු කිරීමට අපගේ අවධානය යොමු වේ.

**අපගේ ප්‍රතිපත්තිමය වගකීම්:**

A. නීති සහ අනෙකුත් නියාමන වලට අනුකූලත්වය සහතික කිරීම සඳහා පාලන ව්‍යුහයන් සහ වඩාත් යෝග්‍ය ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම.

B. තිරසාර සංවර්ධන අරමුණු (Sustainable Development Goals) සාක්ෂාත් කර ගැනීමට, සමාගමේ ස්වේච්ඡා අනුමැතිය ඇති එක්සත් ජාතීන්ගේ ගෝලීය සම්මතයේ මූලධර්ම දහය (Ten principles of the UN Global Compact), කාන්තාවන් බලගැන්වීමේ මූලධර්ම (Women’s Empowerment Principles) ඇතුලු වෙනත් ස්වේච්ඡා අනුමැතියන්ගේ ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම.

C. අවංකභාවය, විනිවිදභාවය සහ වගවීම සුරකිමින් ව්‍යාපාර පවත්වාගෙන යාම සහ දූෂණය, අල්ලස, වංචාව සහ සදාචාර විරෝධී හැසිරීම් වලට එරෙහිව කිසිදු සහනයක් නොදීමේ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාම.

D. පාරිසරික බලපෑම් හඳුනා ගැනීම සඳහා ‘පූර්වාරක්ෂක මූලධර්මය’ (precautionary principle) පිළිපැදීම සහ අහිතකර පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා පාරිසරික කළමනාකරණ පද්ධති භාවිතා කිරීම.

E. ආපදා අවදානම් අවම කිරීම (DRR) සහ අඛණ්ඩ ව්‍යාපාර මෙහෙයුම් කළමනාකරණය (BCM) උපාය මාර්ග ඒකාබද්ධ කිරීම මගින් දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් සහ අනෙකුත් ස්වභාවික/මිනිස්-මූලික ආපදා කළමනාකරණය කිරීම, ආයතනික මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සහ පාර්ශවකරුවන් ආරක්ෂා කිරීම.

F. තිරසාර සංවර්ධනය සඳහා අවැසි උපාය මාර්ගික මැදිහත්වීම් සවිමත් කිරීමටත්, පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සහ අපගේ නිෂ්පාදන සහ සේවා ප්‍රතිපාදන වැඩිදියුණු කළ හැකි අවකාශයන් හඳුනා ගැනීමටත්, අපගේ පාර්ශවකරුවන්ගෙන් ප්‍රතිචාර එක්රැස් කිරීමට ක්‍රමවේදයන් ස්ථාපනය කිරීම.

G. වගකීම් සහිතව සහ සදාචාරාත්මකව ව්‍යාපාර පවත්වාගෙන යාමට සැපයුම් දාමයන් තුළ සිටින අපගේ හවුල්කරුවන් දිරිමත් කිරීම සහ සහාය වීම.

H. උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලියන්හීදී, සමාජීය සහ පාරිසරික පාලනය සම්බන්ධවූ මිණුම් තත්වයන් සහ වගකීම් සහිත ආයෝජන සඳහා වූ මාර්ගෝපදේශ ඒකාබද්ධ කිරීම.

J. ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාව, ඵලදායීතාව සහ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා ආයතනික ක්‍රියාවලි දියුණු කිරීම සහ පූර්ව ක්‍රියාකාරී අවදානම් කළමනාකරණ මෙවලම් යොදාගැනීම.

K. ආයතනික ක්‍රියාවලි සහ පාරිභෝගික නිෂ්පාදන/සේවා අඛණ්ඩව නවෝත්පාදනය කිරීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම.

L. තත්ව කළමනාකරණයේ විශිෂ්ටත්වය, සන්නාමයේ අඛණ්ඩතාව සහ පාරිභෝගික අත්දැකීම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහතික කිරීම.

M. හවුල්කාරිත්වයන්, රැකියා උත්පාදනය, මිලදී ගැනීම් සහ වෙනත් උපායමාර්ගික මැදිහත්වීම් හරහා දේශීය/ ස්ථානීය ප්‍රජාවන් සඳහා තිරසර වටිනාකමක්/ දිගුකාලීන අගයක් ජනනය කිරීම.

N. සියලුම පාර්ශවකරුවන් සඳහා ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් සහතික කිරීම සඳහා වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණ කළමනාකරණ පද්ධති භාවිතා කිරීම.

O. විවිධත්වය හා සමානාත්මතාවය තහවුරු කරමින්, ප්‍රගතිශීලී සේවා බලකායක් වර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය කුසලතා සහ දක්ෂතා ආකර්ෂණය සහ රඳවා ගැනීම, නිපුණතා සංවර්ධනය සහ රැකියා ප්‍රවර්ධන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම.

P. ජාත්‍යන්තරව ප්‍රකාශිත මානව හිමිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට සහය දීම සහ ව්‍යාපාර සහ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ අනුකූලව සියලුම පාර්ශවකරුවන්ට සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් සහ හිරිහැරවලින් තොර ආරක්ෂිත සහ සමානාත්මතාවයෙන් යුත් සේවා පරිසරයක් සැපයීමට කටයුතු කිරීම.

Q. සමාගම පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු පාර්ශවකරුවන්ට ලැබීම සහතික කිරීම සඳහා ගෝලීය වාර්තාකරණ මූලපිරීම (Global Reporting Initiative) ඇතුළුව අනුමත කරන ලද ජාත්‍යන්තර මිණුම් දඬුවලට අනුකූලව විනිවිදභාවයෙන් සහ වගකීමෙන් යුතුව කාර්ය සාධන තොරතුරු කළමනාකරණය කර වාර්තා කිරීම.

R. ආයතනයේ තොරතුරු තාක්ෂණ පද්ධතිය සහ සංවේදී තොරතුරු ආරක්ෂා කිරීම උදෙසා, අදාළ අවදානම්වලට නිරතුරුව අවධානය යොමු කරමින්, අදාළ නීතිරීති, මාර්ගෝපදේශ, ප්‍රතිපත්ති, ක්‍රමවේද සහ ක්ෂේත්‍ර ප්‍රමිතීන් සමඟ අනුකූල වන පරිදි කටයුතු කිරීම.

S. ආයතනික සන්නිවේදන ක්‍රමවේද, වගකීමෙන් යුතු, විශිෂ්ට, සදාචාරාත්මක සහ අවංකභාවය පිළිබඳ ප්‍රමිතීන්ට අනුකූලවීම ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පාලනයන් සහ මාර්ගෝපදේශ ස්ථාපනය කිරීම.

T. සියලු ආයතනික මෙහෙයුම් වලදී මානුෂීය සහ සදාචාරාත්මක භාවිතයන් තහවුරු කරමින් ජෛව විවිධත්වය, වනජීවී සහ සංවේදී පරිසර පද්ධති මත 'ශුද්ධ ධනාත්මක බලපෑමක්' (Net Positive impact) සහතික කිරීම.

U. මෙම ප්‍රතිපත්තියේ සඳහන් සියලු වගකීම් සඳහා නිර්දේශ කර ඇති ක්‍රමවේදයන් අනුව ක්‍රියාත්මක වී එමගින් ලැබෙන දැනුම සහ මූලික දැක්ම ඉහළ කළමනාකාරීත්වය සමඟ සමාලෝචනය කිරීම සහ ආයතනික උපාය මාර්ගවලට ඇතුළත් කිරීම.

**ක්‍රියාත්මක කිරීම**

එයිට්කින් ස්පෙන්ස් ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය, සමූහ අධීක්ෂණ මණ්ඩලය, සමූහයේ තිරසාර කවුන්සිලය සහ කළමනාකරණ කවුන්සිලය තිරසාරභාවය සඳහා වන අපගේ වගකීම් පිළිබඳ මාර්ගෝපදේශ සහ මඟ පෙන්වීම් සකස් කරන පාලන ආයතන වන අතර එයිට්කින් ස්පෙන්ස් සමූහයේ සමාගම්වල ක්‍රියාකාරීත්වය ද සමාලෝචනය කරනු ඇත.

ආයතනයේ මෙහෙයුම් වලින් ඇතිවන බලපෑම්, අවදානම්, ආයතනයේ අනුකූලතා අවශ්‍යතා සහ පාශර්වකරුවන්ගේ අවශ්‍යතා වල ස්වභාවය සහ ආයතනයේ ස්වභාවය සහ පරිමාණයට සරිලන සමාජ, පාරිසරික සහ ආර්ථික පාලන ප්‍රමුඛතා සපුරාලීමට අවශ්‍ය ක්‍රමවේද සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි හරහා ක්‍රියාවට නැංවීම සඳහා සෑම ව්‍යාපාරික අංශයක්ම නායකත්වය ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම ඒකාබද්ධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ ව්‍යුහයට අනුකූලව හඳුනාගත් මෙහෙයුම් ප්‍රමුඛතා සාකච්ඡා කිරීම සහ ප්‍රතිපත්ති වගකීම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපාරික අංශ වල තිරසාර කමිටු සහ එම කමිටු වල ප්‍රධාන නියෝජිතයන්ගෙන් සමන්විත සමූහයේ තිරසාර කණ්ඩායම වගකිව යුතුය. ඒ සඳහා;

- ආයතනික බලපෑම් පාලනය කිරීම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග මෙම ප්‍රතිපත්තිය අනුගමනය කරන අපගේ සියලුම සමාගම් සඳහා අනිවාර්ය වන අතර එම මූලික ක්‍රියාමාර්ග 'අත්‍යවශ්‍ය' හෝ 'කළ යුතු' ක්‍රියාවන් (essential or 'must do' action) ලෙස ලැයිස්තුගත කර ඇත.

- ආයතනික බලපෑම්, අවදානම්, අනුකූලතා අවශ්‍යතා සහ පාර්ශවකරුවන්ගේඅවශ්‍යතා වල ස්වභාවය සහ පරිමාණය අනුව අපගේ ව්‍යාපාරික අංශ වලින් මූලික ක්‍රියාවන්ට වඩා ගැඹුරු ක්‍රියාමාර්ගයන් අවස්ථානුකූලව බලාපොරොත්තු වන අතර එම ක්‍රියාමාගර්යන් 'කළ යුතු' ක්‍රියාවන් (expected or 'should do' action) ලෙස නිදෙර්ශ කෙරේ. එම ක්‍රියා අදාල ව්‍යාපාරික කමිටු සමඟ ඍජුව සාකච්ඡා කර, අදාල බලපෑම් වලට සරිලන පරිදි ක්‍රියාත්මක කෙරේ.

- ඊට අමතරව, අපගේ ඒකාබද්ධ තිරසර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය, අපගේ ආයතනය ක්‍රියාකරන කර්මාන්තවලට ආවේනික අවශ්‍යතා සඳහා දීර්ඝ කාලීන විසඳුම් සැපයීමට, කෙටි කාලීන විසඳුම් සඳහා සහය දීමට හෝ ආයතනයේ පාර්ශවකරුවන් සඳහා අගය වර්ධනය කිරීමට මාර්ගෝපදේශ සපයයි. මෙම මාර්ගෝපදේශ 'ආදර්ශවත්' හෝ 'කළ හැකි' ක්‍රියාමාර්ග ලෙස මෙම ව්‍යුහයේ හඳුන්වා ඇත (exemplary or 'could do' optional action).

මෙම ප්‍රතිපත්තිය සවිස්තරාත්මකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම්, අධ්‍යාපනය ලබාදීම් සහ ධාරිතා ගොඩනැගීමේ මැදිහත්වීම් සඳහා ආයතනය පහසුකම් සැලසිය යුතුය.

<table>
<tr><th colspan="3">ලියවිලි පාලනය</th></tr>
<tr><th colspan="2">දිනය</th><th>සංශෝධනයේ අනුවාදය</th></tr>
<tr><td>වත්මන් සංශෝධනය පිළිබඳ විස්තර:</td><td>31.03.2024</td><td>- අපගේ අරමුණු වල නිවැරදි නියෝජනය වැඩි දියුණු කිරීම සඳහා සියලු ප්‍රතිපත්තිමය කැපවීම් නැවත සකස් කර ඇත.<br>- ප්‍රාදේශීය ප්‍රජා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශයන් වඩාත් සුදුසු සුසංයෝගයක් සහ පෙළගැස්මක් සඳහා ඒකාබද්ධ කර ඇත (පෙර සටහන් කර තිබූ කැපවීම් M සහ N මෙම සංශෝධනයෙහි කැපවීම M ලෙස ඒකාබද්ධ කර ඇත).<br>- සිංහල සහ දෙමළ පරිවර්තන සංශෝධන සමඟ යාවත්කාලීන කර ඇත.</td></tr>
<tr><td>පෙර සංශෝධන පිළිබඳ විස්තර:</td><td>03.04.2023</td><td>- දෙමළ පරිවර්තනය යාවත්කාලීන කරන ලදී.</td></tr>
<tr><td colspan="3">ආචාර්ය රොහාන් ප්‍රනාන්දු<br>(අධ්‍යක්ෂ - එයිට්කින් ස්පෙන්ස් ආයතනය<br>එයිට්කින් ස්පෙන්ස් සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තිරසාර සංවර්ධන ප්‍රධානී<br>ආයතනයේ තිරසාර කවුන්සිලයේ සභාපති)<br>විසින් සමාලෝචනය කර අනුමත කරන ලදී</td></tr>
</table>